# මහනුවර ගල්මඩුව රජමහා විහාරයේ පවතින විහාර ගෙවල් දෙකේ දක්නට ලැබෙන වාස්තු විද්‍යාත්මක වෙනස්වීම් පිළිබඳ ව අධ්‍යයනයක්

*එස්. එන්. කංකානම්ගේ [1]*

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ අංක 638 ගල්මඩුව ග්‍රාම නිලධාරී වසමේ නත්තරම්පොත ගම්මානයේ ගල්මඩුව රජමහා විහාරය පිහිටා ඇත. මෙම රජමහා විහාරය තුළ එකිනෙකට හාත්පස වෙනස් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ රැසකින් සමන්විත විහාර ගෙවල් දෙකක් දක්නට ලැබේ. ඒ අනුව මෙම අධ්‍යයනය තුළින් ගල්මඩුව රජමහා විහාරයේ දක්නට ලැබෙන විහාර ගෙවල් දෙකේ පවතින වාස්තු විද්‍යාත්මක වෙනස්කම් පිළිබඳ විමසා බැලීම මෙහි මූලික අරමුණ වේ. අධ්‍යයන ක්‍රමවේද ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනයේ යෙදී තොරතුරු ලබා ගැනීම සහ ද්විතීයක මූලාශ්‍රයන් භාවිත කිරීමෙන් තොරතුරු ලබා ගැනීම සිදු කරනු ලැබී ය. ඒ අනුව මහනුවර දිස්ත්‍රික්යේ දක්නට ලැබෙන සුවිශේෂී විහාරයක් ලෙස ගල්මඩුව රජමහා විහාරය හඳුනා ගැනීමට හැකි අතර මෙම විහාරය තුළ අනෙකුත් විහාරයන් තුළ දක්නට නොලැබෙන ආකාරයට එකිනෙකට වෙනස් වාස්තුවිද්‍යාත්මක් ලක්ෂණවලින් සමන්විත විහාර ගෙවල් දෙකක් දක්නට ලැබේ. මෙහි දක්නට ලැබෙන කුඩා විහාර ගෙය වූ ගෙඩිගේ ගොඩනැගිල්ලේ වැඩ අවසන් නොවනා ලකුණු පෙනෙන්නට තුබූ නිසා ගම් වැසියන් විසින් ඉදි කරන ලද්දකි. ඒ අනුව මෙහි දක්නට ලැබෙන කුඩා විහාර ගෙය සාමාන්‍ය විහාර ගෙයක දක්නට ලැබෙන වාස්තු විද්‍යාවකට නිමවා ඇත. අනෙක් ප්‍රධාන විහාරගෙය ඉන්දීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලට අනුව හින්දු කෝවිල් ආකෘතියට නිමවා තිබේ. මෙම විහාර ගෙවල් ද්විත්වය එකිනෙකට වෙනස් මාධ්‍ය භාවිත කර ගොඩනගා ඇත. කුඩා විහාර ගෙය ගඩොල්, දැව භාවිත කොට තනවා හුණු බදාම ආලේප කොට උළු සෙවිලි කර ඇති බව දක්නට හැකි වේ. විශාල විහාරගෙය විශාල වූ කළු ගලින් මුළුමනින් ම නිර්මාණය කොට ඇත. මෙහි ගර්භ ගෘහය, විමාන ගොඩනැගිල්ල හෙවත් ගෙඩිගේ සහ ප්‍රදක්ෂිණා පථයක් යන කොටස්වලින් යුක්ත වේ. ඒ අනුව ගල්මඩුව රජමහා විහාරය සුවිශේෂී වීම සඳහා හින්දු කෝවිල් ආකෘතියට නිර්මාණය කරන ලද ප්‍රතිමාගෘහයෙහි පවතින වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මෙහි දක්නට ලැබෙන අනෙක් කුඩා විහාරගෙයෙහි වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලට බලපෑම් කර ඇති බව හඳුනා ගත හැකි ය.

***ප්‍රමුඛ පද:*** ගල්මඩුව රජමහා විහාරය, වාස්තු විද්‍යාව, ගෙඩිගේ, හින්දු ආභාසය

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණය අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. sasanthi99@gmail.com